SLS Bank
ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව
இலங்கை சேமிப்பு வங்கி
Sri Lanka Savings Bank

## ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ (NSB) පූර්ණ පරිපාලිත බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.



අපගේ සංස්කෘතිය තරඟකාරී මායිම් කරා ළඟාවීම සඳහා සමාජීය වගකීම්, නව්‍ය අදහස් හා පන්නරය යන ගති ලක්ෂණ වලින් සමන්විතව ඇත. අපගේ පෙර නොවූ අයුරු විශ්වාසවන්ත භාවයේ හා සේවයේ වූ කාර්ය සාධනය හේතුවෙන් අපගේ පැතිරිගිය වැඩි වර්ධනය වෙමින් හා වඩා කුළුපග වූ ගනුදෙනුකාර ජාලයක් තුළින් අප අතිශය දියුණු අදියරයක් කරා ළඟාවෙමින් සිටින්නෙමු. දීප ව්‍යාප්තව අපගේ කටයුතු ශාඛා ජාලය තුළින් වැඩි වර්ධනය වෙමින් පවත්නා හෙයින් බැංකුවේ දර්ශනය කරා ළඟාවීම සඳහා නායකත්වය දෙමින්, සැලසුම් සකසමින්, උපායමාර්ග හඳුන්වා දෙමින් / ක්‍රියාත්මක කරමින් හා අධීක්ෂණය කරමින් මෙන්ම මෙම බැංකුවේ සේවයේ සහභාගීත්වයම අභිමානයක් කොට ගත හැකි සාර්ථකත්වයේ දිශානතියෙහි ගිඳිමින් කටයුතු කළ හැකි ක්‍රියාශීලි පුද්ගලයින් අවශ්‍යව ඇත. මෙය ඔබගේ සිහිනය කරා සැබවින්ම ළඟාවිය හැකි අවස්ථාවක් වනු ඇත.

## ප්‍රධාන කළමනාකරු - ලීසිං හා SME

**රැකියා විස්තරය :**

- SME හා ලීසිං සඳහා සමස්ත මෙහෙයුම් කටයුතු සඳහා වගකිව යුතු වන අතර, ඒ සඳහා සැලසුම් කිරීම, අධීක්ෂණය හා ඉලක්ක ළඟාකර ගැනීම හා ශේෂපත්‍ර වර්ධනය අයත් වේ.
- SME හා ලීසිං සේවාදායකයන්ගේ මූලික ණය ලබාදීමට ඇති සුදුසුකම් අගැයුම් කිරීම හා ණය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ හා අවශ්‍යතා අනුගාමීව තත්ත්වයෙන් ඉහළ ණය යෝජනා කලට වේලාවට ඉදිරිපත් කිරීම සහතික කිරීම අතරතුර, නියමිත අක්‍රිය ණය (NPL) හා සමාගමේ අවදානම් ආයෝජන (PAR) පරාමිතීන් හි නියමිත SME ආයෝජන තත්ත්ව හා ලීසිං ආයෝජන පවත්වා ගැනීම සිදුකළ යුතුය.
- SME හා ලීසිං යෝජනාක්‍රම සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් අත්පොත් සංවර්ධනය හා ප්‍රතිපත්ති මනාව සංවිධිත කිරීම සඳහා SME හා ලීසිං කණ්ඩායමට සහාය වීම.
- SME හා ලීසිං සඳහා ඇති ඉලක්ක වෙළඳපොළ හඳුනාගැනීම හා එම වෙළඳපොළට ගැළපෙන ණය යෝජනා ක්‍රම හා ඊට බැඳුණු ගනුදෙනුකරුවන්ට ආවේනික සේවා පිළිබඳ නිර්දේශ කිරීම.
- ශාඛා ජාලයෙහි SME හා ලීසිං නිකුත් කිරීමේ මෙහෙයුම් හා ණයදීමේ පරිචයන් ශක්තිමත් කිරීම, සංවර්ධනය කිරීම හා SME හා ලීසිං කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.

**අයදුම්කරුගේ විස්තරය**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් උපාධියට සමාන වෘත්තිය සුදුසුකමක් සහ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් MBA උපාධියක් සමග වසර 9 ක පශ්චාත් SME හා ලීසිං සම්බන්ධ පළපුරුද්දක් තිබිය යුතු අතර ඉන් වසර 5 ක් කළමනාකරණ තනතුරක සේවය කර තිබීම.

හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් උපාධියට සමාන වෘත්තීය සුදුසුකමක් සමග වසර 11 ක පශ්චාත් SME හා ලීසිං සම්බන්ධ පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 5 ක් කළමනාකරණ තනතුරක සේවය කර තිබීම.

හෝ

- AIB හෝ බැංකු කළමනාකරණ ඩිප්ලෝමාවක් සමග වසර 13 ක පශ්චාත් SME හා ලීසිං සම්බන්ධ පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 5 ක් කළමනාකරණ තනතුරක සේවය කර තිබීම.

## ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අවදානම් කළමනාකරණ හා අනුකූලතා

**රැකියා විස්තරය**

- බැංකුවට උපායමාර්ගික අවදානම් කළමනාකරණ කාර්යරාමුවක් සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, ඒසඳහා අවදානම් හඳුනාගැනීම පාලනය හා අධීක්ෂණය මෙන්ම සැලසුම් සකස් කිරීම අයත්වන අතර, අවදානම් කාණ්ඩයන් වන ණය, ද්‍රවශීලතාවය, වෙළඳ පොළ, මෙහෙයුම්, නීති හා අනුකූලතා කෙරෙහි අවදානය යොමුකළ යුතුය.
- දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අනෙකුත් කාර්ය මණ්ඩලය සමග සම්බන්ධීකරණය කිරීම මගින් බැංකුව තුළ අවදානම් කළමනාකරණ සංවර්ධනය හා පවත්වා ගැනීම හා තිරසාර අවදානම් කළමනාකරණ සංස්කෘතියක්/ පරිචයන් බැංකුව තුළ වර්ධනය කිරීම සඳහා සියලු අංශ ප්‍රධානීන් හා නිලධාරීන් සමග සාමූහිකව කටයුතු කිරීම.
- නියාමන, ව්‍යවස්ථාපිත නීති හා රෙගුලාසි සඳහා අනුකූලත්වය සමග අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන් ස්ථාපනය කර ඇති බව සහතික කිරීම.
- AML / CFT හා නැගී එන අනුකූලතා අවදානමට බැංකුවේ පිළිපැදීම සහතික කිරීම.
- අවදානම් හා අනුකූලතා කණ්ඩායම්වලට නායකත්වය හා දිශානතිය ලබාදීම හා කාර්ය මණ්ඩලය හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් පුහුණු කිරීම.

**අයදුම්කරුගේ විස්තරය**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් උපාධියකට සමාන වෘත්තිය සුදුසුකමක් සහ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් MBA උපාධියක් සමග වසර 8 ක පශ්චාත් අවදානම් කළමනාකරණ කටයුතුවල නියැලීමේ පළපුරුද්දක් තිබිය යුතු අතර ඉන් වසර 5 ක් බැංකු හෝ මූල්‍ය ආයතනයක කළමනාකරණ තනතුරක සේවය කර තිබීම.

හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් උපාධියට සමාන වෘත්තිය සුදුසුකමත් සමග වසර 10 ක පශ්චාත් අවදානම් කළමනාකරණ කටයුතුවල නැයැලීමේ පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 5 ක් බැංකු හෝ මූල්‍ය ආයතනයක කළමනාකරණ තනතුරක සේවය කර තිබීම.

හෝ

- AIB හෝ බැංකු කළමනාකරණ ඩිප්ලෝමාවක් සමග වසර 12 ක පශ්චාත් අවදානම් කළමනාකරණ කටයුතු වල නියැලීමේ පළපුරුද්දක් තිබිය යුතු අතර ඉන් වසර 5 ක් බැංකු හෝ මූල්‍ය ආයතනයක කළමනාකරණ තනතුරක සේවය කර තිබීම.

හෝ

- අ.පො.ස සා/පෙළ හා අ.පො.ස. උ/පෙළ විභාග සමත්වීම සමග වසර 25 ක අවදානම් කළමනාකරණ කටයුතුවල නියැලීමේ පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 5 ක් බැංකු හෝ මූල්‍ය ආයතනයක කළමනාකරණ තනතුරක සේවය කර තිබීම.

## සමාජ මාධ්‍ය ප්‍රවර්ධක / මාධ්‍ය සම්බන්ධීකාරක (කොන්ත්‍රාත් පදනම මත)

**රැකියා විස්තරය**

- බැංකුවේ සමාජ මාධ්‍ය ප්‍රවේෂයන් සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීම හා ඒවා නිරතුරුව පවත්වා ගැනීම.
- බැංකුවේ ප්‍රතිරූපය නංවාලීමට හා ගනුදෙනුකාර තෘප්තිය වර්ධනය කිරීම සඳහා අලෙවිකරණය, වෙළඳ නාමකරණය හා දැන්වීම්කරණය පිළිබඳ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
- නවීන මෘදුකාංග භාවිතා කරමින් දැන්වීම්, බැනර් හා අනෙකුත් ප්‍රවර්ධනයන් සංවර්ධනය කිරීමේ හැකියාව.
- මාධ්‍ය නියෝජිතයන් සමග සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් නිරතුරුව ඔවුන් හා සබඳතා පවත්වමින් කටයුතු කොට බැංකුව විසින් සංවිධානය කරනු ලබන සේවා හා ප්‍රවෘත්ති වටිනාකමක් ඇති අවස්ථා පිළිබඳ යාවත්කාලීන කිරීම.
- ප්‍රවෘත්ති පත්‍රවල හා සඟරාවල පළකිරීම සඳහා පුවත්පත් නිවේදන කෙටුම්පත් කිරීම හා සංස්කරණය කිරීම හා මුද්‍රිත නිවේදන සංස්කරණය කිරීම.

**අයදුම්කරුගේ විස්තරයක්**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් උපාධියට සමාන වෘත්තිය සුදුසුකමක් සමග වසර 03 ක පශ්චාත්, මාධ්‍යයට සම්බන්ධ ප්‍රසිද්ධ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ සේවය කර පළපුරුද්දක් තිබීම,

හෝ

- අ.පො.ස. (ස/පෙළ) විභාගය, ගණිතය, සිංහල හෝ දෙමළ සහ ඉංග්‍රීසි ඇතුළත්ව සම්මාන සාමර්ථ 5 සහිතව සහ අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වීම සමග පශ්චාත් වසර 06 ක මාධ්‍යයට සම්බන්ධ ප්‍රසිද්ධ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ සේවය කර පළපුරුද්දක් තිබීම.

ඔබ ඉහත සුදුසුකම් හා හැකියාවන් වලින් පරිපූර්ණ අයෙකුනම් අපගේ වෙබ් අඩවිය වන www.slsbank.lk වෙතින් අදාළ අයදුම්පත බාගත කර ගැනීම හෝ careers@slsbl.lk වෙත ඉල්ලීමක් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කොට එවීමෙන් හෝ careers@slsbl.lk වෙත ඊමේල් කිරීමෙන් 2020 නොවැම්බර් 04 වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. නියමිත ආකෘතිය මගින් යොමු කරනු ලබන අයදුම්පත් පමණක් භාර ගනු ලැබේ.

**මේ සම්බන්ධයෙන් යම් අයුරකින් බලපෑම් සිදු කිරීම නුසුදුසුකමක් වනු ඇත.**
**කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය බැංකුව වෙත පවතී.**

**ප්‍රධාන කළමනාකරු - මානව සම්පත් සංවර්ධන**
**ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව**
**අංක 265, වෝඩ් පෙදෙස, කොළඹ 07.**

www.slsbank.lk careers@slsbl.lk

Source: Silumina, Sunday Observer (2020.10.25), Application: www.slsbank.lk (2020.10.25)